7th International Conference of Multidisciplinary Approaches (iCMA), 2020
Faculty of Graduate Studies,
University of Sri Jayewardenepura,
Sri Lanka.
ISSN: 2386 – 1509
Copyright © iCMA


# හෘදයාබාධ වැළඳීමේ අවදානම සඳහා නාගරික ජීවන රටාව සිදුකරනු ලබන බලපෑම අධ්‍යයනය කිරීම

ආරච්චි ආර්.

භූගෝලවිද්‍යා දෙපාර්තමේන්තුව, ශාස්ත්‍ර පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව
rushmahansini94@gmail.com

**සාරසංක්ෂේපය**

නාගරීකරණය හමුවේ පුද්ගල ජීවන රටාව පරිභෝජනවාදී ආර්ථික රටාවකට යොමු වී තිබේ. යම් පුද්ගලයකු ජීවත් වන පරිසරය එම පුද්ගලයාගේ චර්යාත්මක සාධක සඳහා බලපෑමක් සිදුකරනු ලබයි. පුද්ගලයාගේ එම ජීවන රටාව රෝගාබාධ ගණනාවකට හේතු වන අතර වර්තමානය වන විට බෝවන රෝගවල සිට බෝනොවන රෝග දක්වා රෝග සංක්‍රාන්තියක් හඳුනාගත හැකි වේ. මෙම අධ්‍යයනයේ මූලික පරමාර්ථය නාගරික ජීවන රටාව හඳුනාගැනීම හා එම ලක්ෂණ හෘදයාබාධයක් වැළඳීමේ දී පුද්ගලයකුට බලපෑම් කරනු ලබන ආකාරය පිළිබඳ ව හඳුනා ගැනීම වේ. අධ්‍යයන ප්‍රදේශය ලෙස ගම්පහ මහනගර සභා සීමාව කලාපකරණයකට ලක් කර එම කලාපවල වැඩි ම ජන සංඛ්‍යාවක් සිටින ග්‍රාම නිලධාරී වසම් 4ක් තුළින් අහඹු ලෙස තෝරාගත් ගෘහ කුටුම්භ 90ක් සඳහා ප්‍රශ්නාවලි භාවිත කර තිබේ. අධ්‍යයන ප්‍රදේශයේ නාගරික ජීවන රටාව හඳූනාගැනීමේ දී නාගරික ජනසංඛ්‍යාව, ජනඝනත්වය, ආර්ථික ක්‍රියාකරකම්, සේවා ස්ථාන, මාර්ග හා ඉදිකරන ලද ප්‍රදේශයන්ගේ ව්‍යාප්තිය යනාදි කරුණු ප්‍රධාන වශයෙන් අධ්‍යයනය කර තිබේ. හෘදයාබාධ වැළඳීමේ සාධක ලෙස ආහාර රටාව, ශරීර අක්‍රියතාවය, පරිසර ක්ලමථකාරක, ශරීර ස්කන්ධ දර්ශකය හා වෙනත් බෝනොවන රෝග පිළිබඳ ව පමණක් අවධානය යොමුකරනු ලැබී ය. මෙම අධ්‍යයනය සඳහා සිතියම් විද්‍යාත්මක ක්‍රම ලෙස ආසන්න අසල්වාසී විශ්ලේෂණ ක්‍රමය, උණුසුම් ස්ථාන විශ්ලේෂණය හා බහුවලයන් සහිත සීමාන්තරික කලාපකරණයත් භාවිත කර ඇත. නාගරික ජීවන රටාව හා හෘදයාබාධ වැළඳීමේ අවදානම් සාධක අතර පවතින සම්බන්ධය විශ්ලේෂණ සඳහා ප්‍රමාණාත්මක ක්‍රම යටතේ ප්‍රධාන සංරචක විශ්ලේෂණ ක්‍රමය, ප්‍රතිපායන විශ්ලේෂණය හා සහසම්බන්ධතා සංගුණකය යොදාගන්නා ලදි. අධ්‍යයනය කරන ලද ගෘහ කුටුම්භ අනුව බලපාන ලද ප්‍රධාන සාධක අතර ආහාර රටාව හා පාරිසරික ක්ලමථකාරක හෘදයාබාධයක් වැළඳීමේ දී වැඩි බලපෑමක් සිදුකර තිබේ. ආහාර රටාව හා ශරීර ස්කන්ධ දර්ශකය අතර සම්බන්ධය ප්‍රතිලෝම සම්බන්ධයක් (P=0.3679 (ස්ත්‍රී)/0.153 (පුරුෂ)) ද ශරීර ස්කන්ධ දර්ශකය හා ශරීර අක්‍රියතාවය අතර අනුලෝම සම්බන්ධයක් (P=0.02819) පවතින බව හඳුනාගත හැකි ය. නාගරික කේන්ද්‍රයේ සිට නාගරික පරිධි කලාපවලට ගමන් කිරීමේ දී හෘදයාබාධ වැළඳීමේ සාධක හා දුර අතර සෘණ සහසම්බන්ධයක් පවතිනු ලැබේ. කාලීන හා ක්ෂේත්‍රීයව නාගරීකරණය මූලික කරගෙන පුද්ගලයින්ගේ ජීවන රටාව බෝනොවන රෝග වැළඳීමේදී බලපෑමක් සිදුකරනු ලබන බව මෙම අධ්‍යයනය තුළින් හඳුනාගත හැකි විය.

***ප්‍රමුඛ පදඃ*** ජීවන රටාව, හෘදයාබාධ, නාගරීකරණය